බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
External Degrees and Extension Courses Unit
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
University of Sri Jayewardenepura

| | | | | |
|---|---|---|---|---|
| මගේඅංකය My Number | USJP/EEX/08/2025 | ලිපිනය Address | තැපැල් පෙට්ටිය 10, ගංගොඩවිල Post Box 10,Gangodawila නුගේගොඩ, ශ්‍රී ලංකා Nugegoda, Sri Lanka, |
| ඔබේඅංකය Your Number | | | |
| දුරකථනය Telephone | 011-2801481,011-3132496 0113-485402 | වෙබ්අඩවිය Website | www.external.sjp.ac.lk |
| ෆැක්ස් Fax | 011-2802753 | විද්‍යුත් තැපැල E-mail | exams.eedecu@sjp.ac |


2025-01-02

ගරු ස්වාමීන්වහන්ස /ප්‍රිය ශිෂ්‍ය/ශිෂ්‍යාවනි,

## 2022 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි II පරීක්ෂණය (නව නිර්දේශය) සඳහා අයදුම්පත් කැඳවීම - 2025

01. **පරීක්ෂණය සඳහා අයදුම් කිරීමට හා පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා පහත උපදෙස් අනුගමනය කරන ලෙස කරුණාවෙන් දන්වමි.**

| | |
|---|---|
| පරීක්ෂණ අයදුම්පත සහ පරීක්ෂණ ගාස්තු ගෙවිය යුතු ගිණුම් අංකය | **external.sjp.ac.lk / Bachelor of Arts (General) External Degree / Examinations / Exam application** යන වෙබ් අඩවියට පිවිස ඉහත ශීර්ෂය යටතේ ඇති වෙබ් පිටුවේ ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය "v" අකුර රහිතව යෙදීමෙන් බාගත (Download) කර ගත හැක. |
| පරීක්ෂණ ගාස්තු | රු. 10,000/= |
| අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය<br><br>ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, තැපැල් පෙට්ටිය අංක 10, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ | නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් පරීක්ෂණ ගාස්තු ගෙවීමෙන් පසුව, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට ප්‍රථම මුදල් ගෙවන ලද රිසිට්පතෙහි සහ විභාග අයදුම්පතෙහි ස්කෑන් කරන ලද පිටපතක් **exams.edecu@sjp.ac.lk** විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කිරීම සහ මෙහි සඳහන් ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන්** එවීම කළ යුතුයි. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ ඉහළ වම් කෙළවරේ පරීක්ෂණයේ නම සඳහන් කළ යුතුවේ. |
| අයදුම්පත් භාරගන්නා අවසාන දිනය | **2025 ජනවාරි 31** |

02. **සැලකිය යුතුයි**

I. ඉහත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා **ඔබ විසින් පාඨමාලා ගාස්තු දෙවන වාරිකය හා තෙවන වාරිකය සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ. දෙවන සහ තෙවන වාරිකය ගෙවීම සඳහා අයදුම්පත්‍ර වෙබ් අඩවියේ පල කර ඇත.**

II. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය **2025 ජනවාරි 31** වන අතර එම දිනයෙන් පසුව කිසිඳු හේතුවක් මත අයදුම්පත් භාර ගනු නොලැබේ.

III. පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා එක් අයදුම්කරුවකු වෙනුවෙන් සුවිශේෂී ගිණුම් අංකයක් බැගින් ඇති අතර අදාළ ගිණුම් අංකයට පමණක් ගෙවීම් කළ යුතුය. **(එහි ඡායාපිටපතක් ළඟ තබාගත යුතු අතර වෙනත් ගිණුම් අංකවලට ගෙවන ලද මුදල් පිලිබඳ විශ්වවිද්‍යාලය වග කියනු නොලැබේ.)**

IV. නියමිත පරිදි මුදල් නොගෙවන ලද, අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

V. 2022 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි II පරීක්ෂණය විභාග කාල සටහන **external.sjp.ac.lk / Bachelor of Arts (General) External Degree/Examinations/TimeTable** යන බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ වෙබ් අඩවියෙහි පල කරන අතර සියළු දැනුවත් කිරිම් වෙබ් අඩවිය හරහා පමණක් සිදුකරන බැවින් නිරතුරුවම වෙබ් අඩවිය පරිශීලනය කිරිම අත්‍යවශ්‍ය වේ.

VI. පරීක්ෂණයට අදාළ කාල සටහන **www.external.sjp.ac.lk** යන බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ වෙබ් අඩවියෙහි පල කරන අතර සියළු දැනුවත් කිරිම් වෙබ් අඩවිය හරහා පමණක් සිදුකරන බැවින් නිරතුරුවම වෙබ් අඩවිය පරිශීලනය කිරිම අත්‍යවශ්‍ය වේ.

VII. විදේශ ගත සිසුන් සඳහා අයදුම්පත් ඉදිරිපත් කර මාර්ගගත ක්‍රමය ඔස්සේ පෙනී සිටිය හැක. ඒ සඳහා වන විස්තර **http://external.sjp.ac.lk/online-exminations-for-migrated-students/** යන වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

VIII. **නියමිත දිනට ඉහත පරීක්ෂණය සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කළ සිසුන්ගේ විභාග ප්‍රවේශපත්‍ර external.sjp.ac.lk/ Bachelor of Arts (General) External Degree/Examinations/Admission Card වෙත පිවිස ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය V අක්ෂරය රහිතව ඇතුලත් කිරීමෙන් ලබාගත හැකි අතර විභාග ප්‍රවේශපත්‍ර තැපැල් මාර්ගයෙන් නිකුත් නොකරන බව කාරුණිකව සලකන්න.**

IX. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය 428 වන සනාතන සභාව විසින් අනුමත කරන ලද සංශෝධිත නව විභාග නීති රීති මාලාව **external.sjp.ac.lk/Bachelor of Arts (General) External Degree/ Examinations/ Rules and Regulations** වෙත පිවිස පරිශීලනය කල හැක.

X. **උපාධියක් සම්පූර්ණ කිරීම** සඳහා අවශ්‍යතාවන් පිළිබඳ විස්තර **www.external.sjp.ac.lk** වෙබ් අඩවියේ පල කර ඇති 2022 අධ්‍යයන වර්ෂයේ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවෙහි ශිෂ්‍ය විවරණිකාව (Prospectus) පරිශීලනය කිරීමෙන් ඔබට ලබා ගත හැකිය.



ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය